# ශ්‍රී ලංකාවේ සිසුන් පාසල් හැර යාමට බලපානු ලබන සාධක පිළිබඳ විමසුමක්

එම්. එල්. සී. යසින්තා[1]


**සංක්ෂේපය**

අධ්‍යයන පසුබිම මුළු මහත් සමාජ දේහයම පෝෂණය වන්නා වූ මූල බීජය වන්නේ අධ්‍යාපනයයි. පරපුරෙන් පරපුරට දැනුම සම්ප්‍රේෂණය කිරීමේ ප්‍රධානම මාධ්‍යය ලෙස පිළිගැනෙන්නේ අධ්‍යාපනයයි. එසේ පවතින දැනුම බෙදා දීමේ ප්‍රධානතම ආයතනය වන්නේ පාසලයි. පාසල යනු විවිධ මට්ටම්වල දරුවන් ඒකරාශී වන ස්ථානයකි. ඒ අතර විවිධ අධ්‍යාපන මට්ටම් වලදී අධ්‍යාපනය හැර යන්නන් මේ සියලු කොටස් නියෝජනය කරයි. මෙසේ ළමුන් පාසල් අධ්‍යාපනය අතරමග නවතා දැමීම වර්තමානය වන විට ලෝකයම මුහුණ දී ඇති ගැටළුවකි. අරමුණ: ශ්‍රී ලංකාවේ සිසුන් පාසල් හැරයාම සම්බන්ධයෙන් බලපානු ලබන හේතු සාධක කවරේදැයි හඳුනාගැනීම මෙම පර්යේෂණය මගින් සිදුවේ. ක්‍රමවේදය: සිසුන් අතරමග පාසල් අධ්‍යාපනය හැරයාම පිළිබඳ විවිධ රටවල පර්යේෂකයින් හා ශ්‍රී ලංකාවේ පර්යේෂකයින් විසින් කරනු ලැබූ පර්යේෂණ අධ්‍යයනය කිරීම මගින් ඔවුන් විසින් සොයාගන්නා ලද පාසල් හැරයාම සඳහා බලපානු ලබන සාධක ඇසුරෙන් සමස්තයක් ලෙස මෙම ගැටළු කෙරෙහි බලපෑම් කරන්නා වූ සාධක පිළිබඳ විමසීමක් මෙමගින් සිදු කර ඇත. ප්‍රතිඵල: මෙම අධ්‍යනය මගින් පාසල් හැරයාම සඳහා බලපාන ප්‍රධානතම සාධක ලෙස ආර්ථික හා සමාජ සාධකය හඳුනාගත් අතර. ඒ අනුව පවුලේ ආර්ථික පසුබිම, දෙමාපියන්ගේ ආදායම් මට්ටම හා රැකියාව ද ඊට අමතරව සාමජ පසුබිම, පවුලේ ප්‍රමාණය, සමාජ පන්තිය, දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටම, දෙමාපිය අපේක්ෂණය යන සාධකද බලපානා බව හෙළිවිය. නිගමනය : මේ අනුව පාසල් හරුයාම හා ආර්ථික සාධක අතර ධන සම්බන්ධතාවක් පවතින බවත් වයස අවුරුදු 14-16 අතර පිරිමි ළමුන් වැඩි ප්‍රතිශතයක් පාසල්හැර ගොස් ඇති බව හෙළිවිය. වයසින් මුහුපුරායත්ම පිරිමි ළමුන් අධ්‍යාපනයට සමුදී රැකියා කෙරේ යොමුවී ඇති බව හඳුනාගත හැකි විය. එසේම පවුලේ සංඛ්‍යාව ඉහළයාම හා දෙමාපිය අධ්‍යාපන මට්ටම අඩුවීම මේ කෙරේ බලපානු ලබයි. ඒ අනුව පාසල් සිසුන්ගේ අධ්‍යාපනය අතරමග නතරවීමට ඔවුන්ගේ පවුලේ ආර්ථික මට්ටම හා පවුල් පසුබිම යන සාධක සෘජුවම බලපානු ලබන බව හඳුනාගත හැකිවිය.


***මුඛ්‍ය පද :*** *අධ්‍යාපනය, පාසල් හැරයාම, අධ්‍යාපන සාධනය, අධ්‍යාපන ගැටළු.*

---

[1] ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය. chathuyasintha@gmail.com

**හැඳින්වීම**

මුළු මහත් සමාජ දේහයම පෝෂණය වන්නා වූ මූල බීජය වන්නේ අධ්‍යාපනයයි. අධ්‍යාපනය මනුෂ්‍යයාගේ සමාජ ජීවිතය හා සම්බන්ධ වූ ක්‍රියා පද්ධතියකි (සෝමරත්න 1961). අධ්‍යාපනය පිළිබඳ බොහෝ විද්වතුන් විවිධ නිරූපනයන් සිදු කොට ඇත. "අධ්‍යාපනය යනු මිනිස් ජීවිතය මුළුල්ලේ ක්‍රියාත්මක වන අනාගත සංවර්ධනයන් අපේක්ෂාවෙන් ඉගෙනීම අතින් ස්වයංපෝෂිත වීමකි. මෙය ජීවත්වීම සඳහා කරන ප්‍රයත්නයක් ද වේ"(මහත්මා ගාන්ධි). "අධ්‍යාපනය යනු හිස් කලයක් පිරවීමක් වැනි ක්‍රියාවක් නොවේ. එය පහන් දල්වන්නාක් බඳු ක්‍රියාවකි"(ප්ලේටෝ). "අධ්‍යාපනය යනු මිනිසා සම්පූර්ණ ජීවිතයක් සඳහා සූදානම් කිරීමකි"(හර්බට් ස්පෙන්සර්). "අධ්‍යාපනය යනු ජීවත්වීමේ ක්‍රියාවලියයි"(ජෝන් ඩිවී). "අධ්‍යාපනය යනු සමාජ ජීවිතය සඳහා ඉදිරියට නොපැමිණි නවකයන් පිරිසක් උදෙසා වැඩිහිටියන් විසින් ගනු ලබන ක්‍රියාදාමයකි"(එමිල් ඩර්ක් හයිම්). (වීරතුංග,1981). මෙසේ අධ්‍යාපනය යන්න මූලික කුසලතා පුහුණු කිරීමක්, චරිත සංවර්ධනය කිරීමක්, වෘත්තීයට පෙර සූදානම් කිරීමක් ලෙස විවිධ ස්වරූපයෙන් අර්ථ දැක්විය හැක. අධ්‍යාපනය මානව චර්යාව හා සම්බන්ධව පවතින ක්‍රියාදාමයක් බැවින් ඒ පිළිබඳ පැහැදිලි එක් අර්ථයක් සැපයිය නොහැක.

මනුෂ්‍ය සමාජය පෝෂණය වන්නේ අධ්‍යාපනයෙන් සේම සමාජය දියුණුවීම ද අධ්‍යාපනය හරහා සිදු වේ. සමාජ ජීවිතය හා අධ්‍යාපනය ක්‍රියාවලිය අතර ඉතා වැදගත් වන්නා වූ අන්‍යෝන්‍යය සම්බන්ධයක් පවතී. එබැවින් සමාජයක සංවර්ධනය හෝ පිරිහීම එම සමාජයේ අධ්‍යාපනය නිසාම සිදු වේ (සෝමරත්න 1961). රටේ අනාගතය වර්තමාන දරු පරපුර බව හැදිනගන්නා ලෝකයේ සෑම රටක් මෙන්ම ශ්‍රී ලංකාවේ ද අධ්‍යාපනය සඳහා විශාල පිරිවැයක් දරන්නේ එය අනාගතය වෙනුවෙන් කරන ආයෝජනයක් ලෙස සලකමිනි. 2014 වසරේ ශ්‍රී ලංකාව අධ්‍යාපනය සඳහා දරණ ලද මුළු වියදම රු.බිලියන 190.2 ක් වේ (මහ බැංකු වාර්තාව, 2015). අධ්‍යාපනය මෙතරම් වැදගත් ක්‍රියාදාමයක් වන්නේ එය සමස්ත ප්‍රජාවටම බලපාන සංකල්පයක් වන බැවිනි. මන්ද අධ්‍යාපනය රටක මෙන්ම සමාජයක ද ඉදිරි ගමන තීරණය කරන්නා වූ ප්‍රධාන සාධකයක් වන බැවිනි.

පරපුරෙන් පරපුරට දැනුම සම්ප්‍රේෂණය කිරීමේ ප්‍රධානම මාධ්‍යය ලෙස පිළිගැනෙන්නේ අධ්‍යාපනයයි. එසේ පවතින දැනුම බෙදා දීමටත්, නව දැනුම ගොඩ නැංවීමටත්, ඉවහල් වන උපකාරී වන ප්‍රධානතම මාධ්‍යය ලෙස පාසලට හිමි වන්නේ අද්විතීය ස්ථානයකි. සමාජයේ පහත් මට්ටමක සිටින ජනතාව ඉහළ මට්ටමකට පා එසවීමට උපකාරී වන ප්‍රධානතම ආයතනයක් ලෙස පාසල පිළිගැනේ. අධ්‍යාපනය ලබාදෙන ප්‍රධාන ආයතනය වන්නේ පාසල වන බැවින් පාසල කෙරෙහි සියලු දෙනා පූර්ණ විශ්වාසය තබා ඇත. නමුත් දරුවකුගේ අධ්‍යාපනය ලැබීම හෝ නොලැබීම තීරණය වන්නේ පාසල තුළ සිදුවන ඉගෙනුම් ඉගැවීම් ක්‍රියාවලිය තුළින් පමණක්ම දැයි නැවත සිතා බැලිය යුතු ගැටළුවකි.

පාසල යනු සුහග හා සෙමින් ඉගෙන ගන්නා දරුවන්, විශේෂ අවධානයක් යොමු විය යුතු දරුවන් යන විවිධ මට්ටම්වල දරුවන් ඒකරාශී වන ස්ථානයකි. මෙවැනි පද්ධතියක් තුළ දරුවා අධ්‍යාපනය සඳහා බද්ධ වන ප්‍රමාණයේ වෙනසක් පවතී. විශිෂ්ඨ ගණයේ දරුවන් පමණක් නොව විශේෂ අවශ්‍යතා ඇති දරුවන් ද ඒ අතරමැද පිරිසක් ද පාසල තුළ ඒකරාශී වන අතර විවිධ අධ්‍යාපන මට්ටම් වලදී අධ්‍යාපනය හැර යන්නන් මේ සියලු කොටස් නියෝජනය කරයි. මෙසේ ළමුන් පාසල් අධ්‍යාපනය අතරමග නවතා දැමීම වර්තමානය වන විට මුළු මහත් ලෝකයම මුහුණ පා ඇති ප්‍රධාන ගැටළුවක් බවට පත්වී හමාරය. අධ්‍යාපනය කෙරෙහි බලපාන  තීරණාත්මක සාධක රාශියක් අතරින් සමාජ අර්ථික සංස්කෘතික හා දේශපාලන සාධක ප්‍රධාන වශයෙන් හඳුනාගත හැක.

අධ්‍යාපනය සර්ව සාධාරණ ලෙස බෙදීයාම පිළබඳ විෂමතා, භෞතික හා මානව සම්පත් බෙදීයාමේ  විෂමතා, අධ්‍යාපනය කෙරෙහි යොමුවන්නන්ගේ විෂමතා පිළබඳ විමසා බැලීමට බොහෝ කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමට සිදු වේ. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 1948.12.10 දින සම්මත කරන ලද මානව අයිතිවාසිකම් සම්මුතියේ 26 වන වගන්තියේ සියලු දෙනා හට ලැබිය යුතු අයිතිවාසිකමක් ලෙස අධ්‍යාපනය දක්වා ඇත. එහි සඳහන් වන්නේ "සෑම කෙනෙකුම අධ්‍යාපනය ලැබීමේ අයිතිය හිමිවෙයි. යටත් පිරිසෙයින් මූලික අධ්‍යාපනයවත් නොමිලේ ලැබිය යුතුය. මූලික අධ්‍යාපනය අනිවාර්ය විය යුතුය. කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය සාමාන්‍යයෙන් හැම දෙනාටම ලබා දිය යුතු අතර උසස් අධ්‍යාපනය දක්ෂකම් අනුව ලැබීමට සියලු දෙනාටම අයිතිවාසිකම් තිබිය යුතුය"(වන්නිආරච්චි, 2004, 11). තවද 1989.11.20 දින එක්සත් ජාතීන්ගේ සංවිධානය ළමා පරපුර මිනිස් සංහතියේ විශේෂ ගණයක් ලෙස සලකා, ළමුන් සතු අයිතිවාසිකම් වෙනම ලේඛණ ගත කල අතර එය ළමා අයිතිවාසිකම් සම්මුතිය නම් වේ. එහි 28 හා 29 දරණ වගන්ති මගින් ළමුන් බුක්ති විඳිය යුතු අයිතිවාසිකමක් ලෙස අධ්‍යාපනය දක්වා ඇත. එය මෙසේය "සෑම ළමයෙකුටම අධ්‍යාපනය ලැබීමේ අයිතිය ඇත. මෙම අයිතිය බුක්ති විඳීම සහතික කරනු සඳහා රාජ්‍යයන් ප්‍රාථමික අධ්‍යාපනය අනිවාර්ය කළ යුතු අතර නොමිලේ සැපයිය යුතුය. සාමාන්‍යය හා වෘත්තීය අධ්‍යාපනය ඇතුළුව ද්විතීක අධ්‍යාපනයේ විවිධත්වය වර්ධනය කළ යුතුය. පාසල් අධ්‍යාපනය  ලැබීම සඳහා දිරි ගැන්වීමට සහ අතරමඟදී පාසල් හැර යාම වැලැක්වීමට පියවර ගත යුතුය"(වන්නිආරච්චි, 2004, 12). එසේම වයස අවුː 5-14 අතර දරුවන්ගේ අධ්‍යාපනය අනිවාර්ය විය යුතු බව ළමා අයිතිවාසිකම් පිළබඳ ප්‍රඥප්තියෙන් ද තහවුරු කර ඇත. වර්තමානය වන විට ලොව බොහෝමයක් රටවල් එම අයිතිය පිළිගෙන ක්‍රියාත්මක කරනු ලබන අතර බොහෝ දෙමාපියන් ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ වුවද දරුවන්ගේ අධ්‍යාපනය කෙසේ හෝ සම්පූර්ණ කිරීමට උත්සාහ දරති. නමුත් එම වයසේ දරුවන්  පාසල් අධ්‍යාපනය අතරමඟ නවතා දැමීම හා පාසල් හැර යාම සමාජ ගැටළුවක් බවට පත්ව ඇත. විවිධ පර්යේෂණ හා සමීක්ෂණ තුළින් ශ්‍රී ලංකාවේ ද මෙම තත්වය වඩාත් බරපතල සංසිද්ධියක් ලෙස හඳුනාගෙන ඇත. මෙවැනි තත්වයක් ඇතිවීමට බලපාන හේතු සාධක ලෙස සමාජ, අර්ථික,

සංස්කෘතික හා දේශපාලන සාධක පවතින බව එම පර්යේෂණ හා සමීක්ෂණ මගින් හෙලවී ඇත.

1967 බ්‍රිතාන්‍යයේ ප්ලව්ඩන් වාර්තාවේ දක්වා ඇති ආකාරයට අඩු ආදායම, දෙමාපිය රැකියාව, දෙමාපිය බුද්ධි මට්ටම, පවුලේ සංඛ්‍යාව අධික වීම, දුප්පත්කම ආදී සාධක දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි බලපාන බව දක්වා ඇත(ප්ලව්ඩන් වාර්තාව,1967). තවද 1971 ඔලිව්බෑන්ක්ස් කරන ලද අධ්‍යනයකින් පවුලේ පසුබිම එනම් අඩු චේතන, රැකියා විරහිත බව, විශාල පවුල්, ප්‍රධාන නිපැයුම්කරු නැති වීම වැනි හේතු නිසා හටගත් දුප්පත්කම දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි බලපාන බව දක්වා ඇත( ඔලිව්බෑන්ක්ස්,1971). එපමණක් නොව 1978 ලංකාවේ මහර අධ්‍යාපනය මණ්ඩලයේ පාසල් හැර යන්නන් පිළිබඳ කරන ලද අධ්‍යනයකින් පෙන්වා දෙන්නේ පවුලේ සමාජ හා අර්ථික පසුබිම දරුවන් පාසල් හැරයාමට බලපාන බවයි(වික්‍රමරත්න,1978). තවද 1978 ගාල්ල අධ්‍යාපනය දිස්ත්‍රික්කයේ ද්විතියික අධ්‍යාපන අවස්ථා පිළබඳ අධ්‍යනයකින් දෙමාපිය රැකියාව, මාසික ආදායම, දෙමාපිය අධ්‍යාපන මට්ටම, පවුලේ ප්‍රමාණය, සමාජ පරිසරය, දෙමාපිය අනුබලය, දෙමාපිය වෘත්තීය අපේක්ෂාව ආදී සාධක දරුවන්ගේ අධ්‍යාපනය මට්ටම කෙරෙහි බලපාන බව දක්වයි(රූබසිංහ,1978). එමෙන්ම පවුල් පසුබිම අධ්‍යාපනයට බලපා ඇති ආකාරය පිළිබඳ චීනය කරන ලද අධ්‍යනයකින් හෙලි වී ඇත්තේ ජීවත් වන ප්‍රදේශය අනුව ද පවුලේ බලපෑම අධ්‍යාපනය සඳහා බලපානු ලබන බවයි. ඉන් හෙළි වී ඇත්තේ සංවර්ධනය අඩු ප්‍රදේශයන්හි අධ්‍යාපනය සඳහා පවුලේ බලපෑම වැඩි බවයි. එහිදී අධ්‍යාපනයට බලපාන වැදගත්ම සාධක ලෙස දක්වා ඇත්තේ ළමයා හා සම්බන්ධ දෙමාපිය අපේක්ෂණය හා මවගේ අධ්‍යාපන මට්ටමයි(Poston,Zhai,Albo,1994). මේ ආකාරයෙන් විවිධ පර්යේෂණ හා සමීක්ෂණ මගින් දරුවන්ගේ අධ්‍යාපන මට්ටම, දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි බලපාන සාධක, දරුවන් පාසල් හැරයාමට බලපාන සාධක පිළිබඳ පර්යේෂකයින් කරුණු දක්වා ඇත. නමුත් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය පාසල් සිසුන් පාසල් අධ්‍යාපනය අතරමග නවතා දැමීමට (පාසල් හැරයාමට) බලපාන සමාජ හා අර්ථික සාධක පිළිබඳ සවිස්තරාත්මකව සිදු වූ පර්යේෂණ පිළිබඳ දත්ත හා වාර්තා පවතින්නේ ඉතා අල්ප ප්‍රමාණයකි. එබැවින් ශ්‍රී ලංකාවේ පාසල් සිසුන් පාසල් පාසල් හැර යාමට බලපාන සමාජ හා අර්ථික සාධක පිළිබඳ විමසා බැලීමක් මෙමගින් සිදු වේ.

සිසුන් පාසල් පාසල් හැර යාම පිළිබඳ අධ්‍යනය කිරීමට ළමුන්ගේ අධ්‍යාපනය කෙරෙහි බලපානු ලබන සාධක කවරේදැයි හඳුනාගැනීම වැදගත් වේ. මෙරට පමණක් නොව වෙනත් රටවල ද බොහෝ පර්යේෂකයින් විසින් ළමුන්ගේ අධ්‍යාපනය කෙරෙහි බලපානු ලබන සාධක පිළිබඳ අධ්‍යනයන් සිදුකර ඇත. එම විවිධ වූ පර්යේෂණ මගින් ඔවුන් හෙළි කරගත් දෑ මෙසේ දැක්විය හැක.

**පවුල් පසුබිම හා ළමයාගේ අධ්‍යාපනය අතර සම්බන්ධය**

1967 දී බ්‍රිතාන්‍යයේ ප්ලව්ඩන් වාර්තාව මගින් පවුල් පසුබිම නියෝජනය කරන සාධක රාශියක් සමග දරුවාගේ අධ්‍යාපනය සම්බන්ධ වන බව දක්වයි. ඔවුන් පෙන්වා දෙන අන්දමට අඩු ආදායම, දෙමාපිය රැකියාව, පවුලේ සංඛ්‍යාව අධික වීම, දුප්පත්කම හා ගෙදර ජීවිතය දුක් සහිත වීම, පියාගේ හෝ මවගේ මරණය, ගෙදර අය නිතර අසනීප වීම, අයහපත් භෞතික වාතාවරණය, දෙමාපිය නූගත්කම, දෙමාපිය ආදාරය, අනුබලය, මගපෙන්වීම නෙලෙැබීම යන සාධක උසස් බුද්ධියට මෙන්ම යහපත් චිත්තවේග ඇති නොවීමටත් බලපා ඇත. එසේම ඔවුන් මෙම තත්වය විශේෂයෙන්ම පාසල් කාර්ය සාධනය අසාර්ථක වීමට හේතු වන බවද දක්වයි. ඒ අනුව ආදරය පරිසරය පවුල යන විචල්‍යයන් ළමයාගේ බුද්ධි වර්ධනයට කෙරෙහි මෙන්ම පාසල් සාධනය කෙරෙහිත් බලපාන බව ඔවුන් පිළිගෙන ඇත.

1994 දී ඩී. එල්. පෝස්ටන් එන්. සහි ටී ඇල්බෝ ය නඅය චීන මහජන සමූහාණ්ඩුවේ ප්‍රථමික පාසල් 200ක සිසුන් 40000ක නියැදියක් මගින් පවුල් පසුබිම අධ්‍යාපනයට බලපා ඇති ආකාරය අධ්‍යනය කර ඇත.ඒ අනුව පවුලේ බලපෑම ප්‍රදේශ අනුව වෙනස් වන බව පෙනී ගොස් ඇත. සංවර්ධනය අඩු ප්‍රදේශවල පවුලේ බලපෑම වැඩිබවත්. පවුල ආශ්‍රිත සාධක අතරින් අධ්‍යාපනයට බලපාන වැදගත්ම සාධකය වන්නේ ළමයා සම්බන්ධ දෙමාපිය අපේක්ෂණය සහ මවගේ අධ්‍යාපන මට්ටම බව ඔවුන්ගේ අධ්‍යනයෙන් හෙළිවිය. එම අධ්‍යනයට අනුව පවුලේ ආර්ථිකය එතරම් වැදගත් සාධකයක් ලෙස දරුවන්ගේ අධ්‍යාපනයට බලනොපාන අතර කුඩා පවුල් විශාල පවුල්වලට වඩා ඉහළ සාධනයක් පෙන්වයි. ග්‍රාමීය පාසල්වල සිසුන්ට වඩා නාගරික ළමුන් ඉහළ ලකුණු ලබාගන්නා බවක් පෙනෙන්නට නැති බවද අනාවරණය කොට ගෙන ඇත.

1996 දී ශ්‍රී ලංකා සමාජයේ පවුල් සංස්ථාවේ වෙනස්කම් ගැන විමර්ශනයක යෙදෙන ටෙනිසන් පෙරේරා වෙනස්කම් සමග අධ්‍යාපනයේ ඇති සම්බන්ධයද ඉදිරිපත් කර ඇත. නූතන පවුල් සංස්ථාව තුළ ශ්‍රම විභජනය පැහැදිලි ලෙස නොමැති නිසා පුරුෂයින්ගේ රැකියාවල කාන්තාවන් ද නිරත වේ. මේ නිසා අවශ්‍ය සුදුසුකම් උපයා ගැනීමට පවුලක කාන්තාවන් ද පිරිමින් මෙන්ම තරගකාරී අධ්‍යාපනයට යොමු වී ඇත. විවෘත ආර්ථිකය නිසා පවුලේ අය තනි තනිව ආර්ථික අතින් නැගී සිටීමට උත්සාහ දැරීම ද කැපීපෙනේ. පාසල් යන වයසේ ළමුන්ට ද උපයන මාර්ග විවෘත වී තිබීම නිසා අතරමග අධ්‍යාපනය නතර කිරීමට හේතු වන ආර්ථික පරිසරයක් ගොඩනැගී ඇත. විශේෂයෙන් දිළිඳු පවුල්වල අඛණ්ඩ අධ්‍යාපනයට එයබ බාධාවක් වී ඇත.

1994 දී අධ්‍යාපනයේ සම අවස්ථා සම්පාදනයට බලපාන විවිධ සාධක අතර පවුල් පසුබිම අයහපත් වීම ප්‍රබල සාධකයක් බව ආනන්ද ජයවර්ධන විසින් පෙන්වා දී ඇත. මෙහිදී ළමුන්ගේ සමාජ ආර්ථික ස්වභාවය, වාසය කරන ප්‍රදේශය පවුල් පසුබිමට සම්බන්ධ බාධක ලෙස හඳුනාගෙන ඇත. අධ්‍යාපනයේ සම අවස්ථා

සැපයීමේදී ඉහළ සමාජ ආර්ථික පසුබිමක් ඇති නාගරික දෙමාපියන්ට ද්විතීයික අධ්‍යාපන අවස්ථා ලබා ගැනීමේ දී ග්‍රාමීය කෘෂි රැකියාවල නිරත දෙමාපියන්ගේ දරාවන්ට වඩා වැඩි වරප්‍රසාද සහ වාසිසහගතබවක් පවතින බව හෙළි වී ඇත.

**සමාජ පන්තිය හා ළමුන්ගේ අධ්‍යාපනය අතර සම්බන්ධය.**

1971 දී විලියම් එච් සෙවෙල් ගේ මූලිකත්වයෙන් ඇමරිකාවේ විස්කන්සින් සරසවියේ ආචාර්යවරුන් පිරිසක් සමඟ සමාජ පන්තිය හා අධ්‍යාපනය පිළිබඳ ශිෂ්‍යයන් 900ක නියදියක් මගින් අන්වායම අධ්‍යනයක් සිදු කර ඇත. දෙමාපිය ආදායම, ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම, පියාගේ රැකියාව යන සාධක පරීක්ෂා කරනවිට විවිද ආර්ථික කණ්ඩායම්වලට විවෘත වූ අධ්‍යාපන අවස්ථා අසමාන බව හෙළි වී ඇත. පහළ සමාජ තත්වයක් ඇති සිසුවෙකුට වඩා ඉහළ තත්වයක් ඇති සිසුවෙකුට පශ්චාත් අධ්‍යාපනයක් ලබා ගැනීමට 2 1/2 ගුණයකින් වැඩි අවස්ථා ඇති බව මින් තහවුරු විය. එසේම ඇමරිකා එක්සත් ජනපදය තුළ මධ්‍යම පන්තිය තුළ අධ්‍යාපනය පිළිබඳ ඉහළ අපේක්ෂණ ඇති බවත් පහළ සමාජ පන්තිය පහළ මට්ටමේ අපේක්ෂණ ඇති බවත් දක්වයි.

1971 දී ඩග්ලස්, රෝස්, සහ සිම්ප්සන් විසින් සිසුන් 4720 ගේ නියදියක් අධ්‍යනය කළ අතර ඔවුන් දුටුවේ සමාන දක්ෂතා ඇතත් විවිධ සමාජ පන්ති වලින් එන සිසුන්ගේ අධ්‍යාපන ප්‍රාප්ති මට්ටම් අසමාන බවයි. එසෙම කම්කරු පන්තියේ දෙමාපියන්ට වඩා වැඩි අවධානයක් මධ්‍යම පාන්තික දෙමාපියන් තම ළමුන්ගේ පාසල් අධ්‍යාපන කටයුතු සම්බන්ධයෙන් දක්වන අතර ඔවුන්ගේ ළමුන් ක්‍රමයෙන් වැඩෙන විට මෙම උනන්දුව ද ක්‍රමයෙන් වැඩිවන බව පෙනේ.

1991 දී සමාජ පන්තිය හා අධ්‍යාපන අවස්ථා අතර සම්බන්ධයක් ඇති බව ඩබ්. ඒ. සිල්වා විසින් කරන ලද අධ්‍යනයක දී සොයා ගන්නා ලදී. පාසල් අධ්‍යාපනයෙන් ගිලිහී විපතිත වන්නන් අතර පහළ සමාජ ආර්ථික මට්ටමේ අනුපාතය ඉහළ වේ. මෙම ළමුන්ගේ නිවෙස්වල සම්පත් හිඟකම අධ්‍යාපනය හා එහි ඵල පිළිබඳ අවබෝධය අඩු වීම ගිලිහීයාම අසමත්වීම යන දූර්වලතා දැකිය හැකි විය.

මේ ආකාරයෙන් සාමජ ආර්ථික පසුබිම, සමාජ පන්තිය යන සාධක පමණක් නොව දෙමාපියන්ගේ ආදායම් මට්ටම. දෙමාපියන්ගේ රැකියාව. දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටම, නිවසේ පරිසරය, පවුලේ සංඛ්‍යාව ආදී බොහෝ සාධකයන් ළමුන්ගේ අධ්‍යාපනය සඳහා බලපානු ලබන බව විවිධ පර්යේෂණ මගින් හෙළි වී ඇත.

මෙම සියලු සාධකයන්හි සෘජු බලපෑම පාසල් සිසුන් පාසල් හැරයාමට බලපාන බව පෙන්වාදිය හැක. 1978 දී ලංකාවේ මහර අධ්‍යාපන මණ්ඩලයේ පාසල් හැර යන්නන් පිළිබඳ වික්‍රමරත්න කරන ලද අධ්‍යනයකින් පවුලේ සමාජ ආර්ථික පසුබිම හා සම්බන්ධ සාධක අනාවරණය කොට ගෙන ඇත. පවුලේ ආදායම

අඩුවන විට පාසල් හැරයාම වැඩිවන බව ඉන් එක් සාධකයකි. පියාගේ හා මවගේ රැකියාව සමගද පාසල් හැරයාම සම්බන්ධ බව හෙළි වී ඇත. අඩු ආදායම් ලබන හෝ රැකියාවක් නොකරන මව්වරුන් සිටින පවුල්වල පාසල් හැර ගොස් ඇති ප්‍රතිශතය ඉහළ ගොස් ඇත. එසේම පවුලේ ප්‍රමාණය වැඩි වන විටද පාසල් හැර ගොස් ඇති ප්‍රතිශතය ඉහළ ගොස් ඇත. මේ අයුරින් පාසල් සිසුන් පාසල් හැරයාමට සාමජ ආර්ථික පසුබිම, සමාජ පන්තිය යන සාධක පමණක් නොව දෙමාපියන්ගේ ආදායම් මට්ටම. දෙමාපියන්ගේ රැකියාව. දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටම, නිවසේ පරිසරය, පවුලේ සංඛ්‍යාව යන කාරණා රාශියක් බලපානු ලබන බව දැක්විය හැක.

**සාරාංශය**

මේ අයුරින් ශ්‍රී ලංකාවේ සිසුන් පාසල් හැර යාමට බලපානු ලබන සාධක පිළිබඳ විමසා බැලීමේ පෙනීයන ප්‍රධාන සාධක ලෙස සාමජ ආර්ථික පසුබිම, සමාජ පන්තිය, දෙමාපියන්ගේ ආදායම් මට්ටම, දෙමාපියන්ගේ රැකියාව, දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටම, මව විදේශගත වීම, දෙමාපිය අපේක්ෂණය, ආදී සාධක රැසක් බලපානු ලබන බව දැක්විය හැක. ළමුන් ගේ සාමජ ආර්ථික පසුබිම පිළිබඳ සලකා බැලීමේ දී ළමුන්ට අහිතකර සමාජ පරිසරයක් පැවතීමත් දුප්පත්කම පැවතීම ආදී සාධක ඍජුවම හෝ වක්‍රාකාරයෙන් පාසල් හැර යාමට බලපානු ලබන බව දැක්විය හැක. එසේම සමාජ පන්තියද පාසල් හැරයාම සම්බන්ධයෙන් බලපානු ලබයි. පහළ සමාජ පන්තිවල ළමුන් ඉහළ සමාජ පන්තිවල ළමුන්ට සාපේක්ෂව පාසල් හැරයාමේ ප්‍රතිශතය ඉහළබව පර්යේෂණ මගින් හෙළිවී ඇත. පහළ සමාජ පන්තිවල ළමුන් මුහුණ දෙනු ලබන තාඩනපීඩන හේතුවෙන් ඔවුන්ගේ අධ්‍යාපන අතරමග අඩාල වේ. දෙමාපියන්ගේ ආදායම් මට්ටම පහළයාම හේතුවෙන් ළමුන්ගේ අධ්‍යාපනය අතරමග නතර කර දමා ඔවුන් ද පවුලේ ආර්ථිකයට උරදීම හේතුවෙන් පාසල් හැරයාමට ඔවුන්ට සිදු වී ඇත. අධ්‍යාපනයට අවශ්‍ය මුදල් නොමැතිකම ද මේ සඳහා බලපානු ලබයි. දෙමාපියන්ගේ රැකියාව යන සාධකයද පාසල් හැරයාමට බලපානු ලබයි. ඉහළ රැකියාවල නිරත වන දෙමාපියන් තම දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් වැඩි උනන්දුවක් දැක්වුව ද පහළ රැකියාවල නිරත වන දෙමපියන් තම දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් දක්වන උනන්දුව අඩුකම ද ළමුන් පාසල් හැරයාමට බලපානු ලබයි. දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටම සැලකීමේදී ද අඩු අධ්‍යාපන මට්ටමක් සහිත දෙමාපියන් දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් දක්වන උනන්දුව අඩුකම ද ළමුන් පාසල් හැරයාමට බලපානු ලබයි. එසේම මව විදේශගත වීම හෝ මව හෝ පියා මිය යෑම ද දරුවන්ගේ අධ්‍යාපනය අඩාලවීමට බලපානු ලබයි.දෙමාපිය අපේක්ෂණය ද ළමුන්ගේ අධ්‍යාපනය අඩාලවීමට සේම පාසල් හැරයාමට ද බලපානු ලබයි. ළමුන් පිළිබඳ දෙමාපියන් තුළ පවතින අපේක්ෂණය. දරුවන් කෙරෙහි තබනා විශ්වාසය. දෙමාපිය ආදරය හා කරුණාව යන මේ සියලුම දෑ ළමුන්ගේ අධ්‍යාපනය සඳහා බලපානු ලබයි. මේ අනුව

පාසල් ළමුන් පාසල් හැරයාම සම්බන්ධයෙන් ආර්ථික හා සමාජීය සාධක සෘජුවම හෝ වක්‍රාකාරයෙන් බලපානු ලබන බව දැක්විය හැක.

**ආශ්‍රිත ග්‍රන්ථ**


අතුකෝරළ, ඩී, ආර්., අතුකෝරළ, එච්, එන්. (1991). *අධ්‍යාපන මූලධර්ම ලිපි.* 305,ලියෝ මාවත,සිංහාරමුල්ල,කැලණිය, ශීලා ප්‍රින්ටින් වර්ක්ස්.

ජයවර්ධන ආනන්ද, එස්. (2000).ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ගැටළු. *අධ්‍යාපන විමර්ශන.* 1 කලාපය, 1-2.

ගලගමගේ,එස්. (2006). පවුලේ රැකියා පසුබිම හා දරුවන්ගේ අධ්‍යාපන අවස්ථා. *අධ්‍යාපන.* අංක 36 කලාපය, 78-85.

ගුණසේකර, එස්., බුත්පිටිය, ජේ. (1994). *ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ අර්බුදය.* 94/1 ,අතුරුගිරිය පාර කොට්ටාව, සාර ප්‍රකාශන.

බණ්ඩා තිලකරත්න, ඩී, එම්. (1994). *ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ලිපි සරණිය.* 162/40, පැලවත්ත, පන්නිපිටිය, එඩ්නේ එන්ටප්‍රයිසස් ප්‍රයිවට් ලිමිටඩ්.

රුබේරු රංජිත්, ටී. (1964). *ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පරිණාමය (1 කොටස).* එම් ඩී ගුණසේන සහ සමාගම, කොළඹ.

වන්නිආරච්චි, ජේ, පී. (2004). *C.W.W.කන්නන්ගර චින්තනය හා අධ්‍යාපන කතා පුවත.* 2 පී/1,පහළයාගොඩ,ඉඹුල්ගොඩ, සෙනරත් ප්‍රකාශන.

වීරතුංග,එන්. (1981). *අධ්‍යාපන මූලධර්ම,අධ්‍යාපන නීතිය හා පරිපාලනය.* 142,අවිස්සාවේල්ල පාර,වැල්ලම්පිටිය, චරක මුද්‍රණ ශිල්පියෝ සහ ප්‍රකාශනයේ.

සිරිසේන,එච්. (1999). *ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ප්‍රතිපත්ති පරමාර්ථ හා අරමුණු.* නූතන භාෂා අංශය, කැලණිය විශ්ව විද්‍යාලය.

රූපසිංහ,පී. (1978) ගාල්ල අධ්‍යාපන දිස්ත්‍රික්කයේ ද්විතීයික අධ්‍යාපන අවස්ථා පිළිබඳ අධ්‍යනයක්. අප්‍රකාශිත අධ්‍යාපනපති නිබන්ධනය. කොළඹ විශ්ව විද්‍යාලය.

Douglas,J.W.B.,Rose , J.M. and Simpson,H.R.,(1971).All our future. London;Peter Davies,Énther.

Plowden Repoet(1967),Grade Britain Children and Their Primary Schools, Dep of Education and Science,Central AdvisoryConcil for Educational Research and Surveyes,London.

Sewell William,H.(1971),Inequality of Opportunity for higher Education , American Sociological Review.

Central Bank Of Sri Lanka. (2016.06.11) Retrieved from https://www.googel.lk/search?q=central+bank+report+2015&oq=central+bank+report+2015&qs